ආඛ්‍යාන narrations
**Volume 07 | Issue 01 | January - June 2022 | Article 05**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: director@cikcs.sab.ac.lk

CC BY NC ND

# කතෝලික පසන් ගීත සාහිත්‍යයෙහි නිරූපිත කන්‍යා මරියා මාතෘ වැලපුම

**ඉරංගා සමින්දනී වීරක්කොඩි**, සී. ද. එස්. කුලතිලක සංරක්ෂණ හා පර්යේෂණ ඒකකය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, iranga.w@vpa.ac.lk

**සාරසංක්ෂේපය**

මාතෘ දෙවඟන පිදීමේ සංකල්පය ලාංකේය උපසංස්කෘතීන්හි විවිධ පර්යාලෝක අනුව දිස්වන්නකි. යටත්විජිත සමයේ දී මෙරටට සංක්‍රමණය වූ කන්‍යාමරිය ඇදහීම ද එය කතෝලික ආගම සමඟ මෙරට ජන වන්දනාවට එක් වූ මාතෘ දේව ඇදහිලි විශේෂයකි. ශ්‍රී ලාංකේය පසන් සංගීත ප්‍රකාශනයෙහි මාතෘ දේව වැලපුම් දැකිය හැකි වේ ද? එහි සාහිත්‍යමය ආභාසය කෙබඳු ද? යන පර්යේෂණ ප්‍රශ්න පිළිබඳ මෙහිලා විමසා බැලෙයි. මෙය ගුණාත්මක අධ්‍යයනයකි. ක්ෂේත්‍ර අධ්‍යයනය විධික්‍රම මෙහිලා උපයෝගි කර ගැනිණ. ලාංකික ජන හදවත්වලට කිඳා බැසගත් ‘මාතෘ සංකල්පය’ භාව උද්දීපනය සඳහා ප්‍රබල ව යොදා ගත් ගොන්සාල්වේස් පියතුමා, පසන් ගායන ඒ සඳහා වාහකයක් කර ගත් බව මෙහිලා ගම්‍ය වූවකි. මෙකී මාතෘ කේන්ද්‍රීය වලප කතෝලික ජන කණ්ඩායම් අතර ප්‍රාදේශීය විවිධත්වයෙන් යුතු ව භාවිත වන බව ද නිරීක්ෂණය වූවකි. කන්‍යාමරියා මාතෘ වැලපුම මානවවංශ සංගීත අධ්‍යයනයේ සුවිශේෂී මානයකි.

**ප්‍රමුඛ පද:** *මාතෘ දේව ඇදහිලි, කතෝලික උප සංස්කෘතිය, දුඃඛප්‍රාප්තිය, වැලපුම් සම්ප්‍රදාය, මානවීය සංගීතවේදය*

## හැඳින්වීම

යටත්විජිත සමයේ දී ආගමික, දේශපාලනික, ඓතිහාසික, අධ්‍යාපනික හා සංස්කෘතික පසුබිම පසන් ගායන සම්ප්‍රදායකට මූල බීජය සැපයූ බව පෙනීයන්නකි. පසන් ගායන හඳුන්වාදුන්නේ දුඃඛප්‍රාප්ති නාටක සහ සංගීතය ප්‍රකාශනය මඟින් ආගමික ප්‍රචාරය සඳහා වඩාත් ඵලදායි මාධ්‍යය ලෙස තෝරා ගැනීමත් සමග ය. පෘතුගීසි ආගමනයත් සමග ඇති වූ කතෝලික ජන වන්දනා පිළිවෙත නිසා පසන් ආගමික චාරිත්‍රය මෙරටට හඳුන්වාදුන්න ද, පසන් ගායන සම්ප්‍රදාය කතෝලික සමාජයට විධිමත් ව හඳුන්වා දෙන ලද්දේ ලන්දේසි පාලන සමයේ දී ය. එසමයෙහි කතෝලික දහම ඇදහූ ජනයාට මෙන් ම පූජකවරුන්ට අනේකවිධ දුක් පීඩාවන්ට මුහුණපෑමට සිදු වූයේ ලන්දේසි පීඩනය හේතුවෙනි. ඔරතෝරියානු නිකායික පූජකවරුන් එම වකවානුවෙහි කතෝලික දහම ව්‍යාප්ත කිරීමට සහ ස්ථාවර කිරීමට ඇප කැප වී කටයුතු කිරීම විශේෂතාවකි. එම පූජකවරුන් ගේ සම්ප්‍රාප්තියත් සමඟ කතෝලික සාහිත්‍ය මෙන් ම ජන වන්දනා නාට්‍ය සහ ජන වන්දනා සංගීතය වෙනස් ම හැඩතලයක් ගත් බව පෙනෙයි. විශේෂයෙන් ගොන්සාල්වෙස් පියතුමා ගේ දායකත්වය මෙහි දී කැපී පෙනෙන්නකි. පියතුමා ගේ ක්‍රිස්තියානි සාහිත්‍යය ව්‍යාපාරය කම්මල හෙවත් කයිමල්වත්ත ප්‍රදේශය මූලික කොටගනිමින්, තෝරාගත් ලිපිකරුවන් ගේ සහාය ලැබ ගෙන සිදු කර තිබේ (ෆොන්සේකා, 1924). ලාංකිකයන් ගේ ජන විඥානය හඳුනාගත් ගොන්සාල්වෙස් පියනම විසින් පසන් ගායන සම්ප්‍රදාය විධිමත් ව ආරම්භ කරන්නේ මෙකී පසුබිම තුළ දී ය. එහි ප්‍රවේශයන් දෙකක් විය. පාස්කු නාට්‍ය හරහා පසන් ගීත භාවිතය එකකි. ඒ

අනුව චතාරික සමය හා සෘජු සබඳතාවක් ඇති 'පාස්කු නාට්‍ය' පසන් ගීත පෝෂණයට යම් බලපෑමක් විය. දෙවැන්න නම් ගෘහස්ත වන්දනාමානයක් ලෙස පසන් ගායන චාරිත්‍රයක් නිර්මාණය වීම ය. එකී සම්ප්‍රදාය පෝෂණය කිරීමට පසුකලෙක දී ගිහි පැවිදි දෙපාර්ශ්වයේ ම දායකත්වය ලබා තිබේ. ඒ අනුව ලාංකේය කතෝලික ප්‍රජාව අතර පැවත එන ජන සම්ප්‍රදායක් ලෙස පසන් ආගමික චාරිත්‍රය සියවස් තුනකට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකේය සමාජය තුළ ප්‍රතිෂ්ඨාපනය වූවකි.

පර්යේෂණ අරමුණු

01. කතෝලික ජන ජීවිතය හා සබැඳි පසන් ආගමික චාරිත්‍රය නිරීක්ෂණය කිරීම

02. පසන් ගායනාවන්හි නිරූපිත මාතෘ වලප අවබෝධ කරගැනීම

03. සාහිත්‍යමය පැතිකඩ පිළිබඳ සාකච්ඡා කිරීම

**පර්යේෂණ විධික්‍රමය**

මෙය ගුණාත්මක පර්යේෂණයකි. මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන විධික්‍රමය යොදාගැනෙයි. එහි දී මානවවංශ පර්යේෂණ ක්‍රමවේද යටතේ සහභාගිත්ව නිරීක්ෂණය, විධිමත් සහ අවිධිමත් සම්මුඛ සාකච්ඡා උපයෝගි කර ගැනිණ. පසන් ගායන ශෛලිය දැනට ශේෂ ව පවත්නා වූ ගම්මාන කරා ගොස් ඔවුන් ගේ ආගමික චාරිත්‍ර නිරීක්ෂණය, පසන් ගායන ශ්‍රවණය, අභිචාරයනට සම්බන්ධ වීම හා ශ්‍රව්‍ය-දෘශ්‍ය පටිගත කිරීම මගින් දත්ත ඒකරාශී කිරීම් ද සිදු කෙරිණ. පර්යේෂණට අදාළ තොරතුරු ලිඛිත සාහිත්‍යයේ පවතින බැවින් විෂයානුබද්ධ විවිධ තොරතුරු එක් රැස් කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීයික මූලාශ්‍රය ද උපයෝගි කර ගැනිණ.

**සාහිත්‍ය විමර්ශනය**

ශ්‍රී ලාංකේය පසන් ගායන අධ්‍යයනය කිරීමේ දී මූලික ආකෘති දෙකක් හඳුනාගත හැකි ය. එකක් ගද්‍ය ආකෘතියකි. අනෙක පද්‍ය ආකෘතියයි. ඒ යටතේ භාවිත කෘති කිහිපයක් හඳුනාගත හැකි ය. 'දුඃඛප්‍රාප්ති ප්‍රසඞ්ගය' ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් විරචිත ගද්‍ය කෘතියකි. මෙහි ජේසු ක්‍රිස්තුන්වහන්සේ ගේ වද විඳීම දක්වා වූ කතා පුවත පිළිබඳ කරුණු ඇතුළත් වේ. විශේෂයෙන් මෙහි උපයෝගිතාව ක්‍රම දෙකකට අනුව සිදුවන බව පෙනී යයි. එකක් පාස්කු නාට්‍ය තුළ භාවිත කිරීම ය. දෙවැන්න තනි පුද්ගලයකු උස් හඬින් සජ්ඣායනා කිරීම ය. සිය නිවෙසේ දී හෝ දේවස්ථානයේ දී හෝ මෙය සජ්ඣායනා කරනු ලබන්නේ ගැහැනු පිරිමි භේදයකින් තොර ව ය. චතාරික සමය තුළ රාත්‍රී කාලයේ දී තෝරාගත් පිටු කිහිපයක් අන්‍යයනට ඇසෙන පරිදි හඬනගා කීම සිරිත ය. මෙකී කෘතියෙහි දේශනා නවයක තොරතුරු ඇතුළත් ය. ගොන්සාල්වෙස් පියතුමා විරචිත දුඃඛප්‍රාප්ති ප්‍රසංගය කෘතියෙහි පද්‍යමය අනුවර්තනය 'දේශනා නවයේ පසන් පොත' ය. සමිඳුන් ගේ උපතේ සිට කුරුසියේ මරණය දක්වා වූ කතා පුවත පද්‍ය ආකෘතිය අනුව මෙහි දී ඉදිරිපත් කෙරෙයි. ජාකෝමේ ගොන්සාල්වෙස් පියනම රචනා කරන ලද 'වේද කාව්‍ය' යනු කිතු සිරිත කවියෙන් කියා පෑමට යත්න දරා ඇති කෘතියකි. එහි ජේසුතුමන් මරණයට පත් වූ විට දෙව් මව් වැලපීම 408-456 කාව්‍යවලින් ඉදිරිපත් වී ඇත්තේ ශෝක සංවේග උපදවන පරිදි ය. එම ප්‍රබන්ධ ද පසන් ගායන සඳහා එක් වී ඇති බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී නිරීක්ෂණය වූවකි. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා රචිත දුඃඛප්‍රාප්ති 'ලතෝනි පොත' වනාහි අප්‍රකට පද්‍ය සංග්‍රහයකි. විශේෂයෙන් දේව මෑණියන් ගේ දෘෂ්ටිකෝණයෙන් රචිත පසන් කිහිපයක් මෙහි ඇතුළත් ය. එකී කෘතියෙහි ඇතුළත් ඇතැම් පසන් ගායන 'ලතෝනි' නමින් පසන් කණ්ඩායම් හඳුනාගෙන තිබුණ ද එවැනි කෘතියක් ගැන අසා නොමැති බව නිරීක්ෂණය වූවකි. මීට අමතර ව 'අත් අකුරු පසම්' යනුවෙන් හැඳින්වෙන පසන් ගීත කිහිපයක් හඳුනා ගත හැකි ය. තම කණ්ඩායම් දීර්ඝ කාලයක් අත් පිටපත් ලෙස පවත්වාගෙන ආ පසන් ගායන මේ නමින් හඳුන්වා ඇති බව පැහැදිලි වන්නකි. එය ද ඉහත පසන් මෙන් මුද්‍රණය වී නොමැත. විවිධ රචකයින් මේ අත් අකුරු පසන් රචනා කර තිබීම විශේෂතාවකි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

මාතෘ දෙවඟන පිදීමේ සංකල්පය ලාංකේය උප සංස්කෘතීන්හි විවිධ පර්යාලෝක අනුව දිස්වන්නකි. යටත්විජිත සමයේ දී මෙරටට සංක්‍රමණය වූ කන්‍යාමරිය ඇදහීම ද එය කතෝලික ආගම සමඟ මෙරට ජන වන්දනාවට එක් වූ මාතෘ දේව ඇදහිලි විශේෂයක් වේ. එමෙන් ම කන්‍යාමරියතුමිය විවිධ නාමයන් ගෙන් ශ්‍රී ලාංකික කතෝලික ඇදහිල්ල තුළ දැකිය හැකි ය (ඩයස්, 2014). පසන් පොතෙහි ඇතුළත් ගායනාවෙහි කතා නායිකාව වන්නේ මරියතුමිය යි. අවස්ථා තුනක දී මෙකී මාතෘ චලප යොදාගෙන පසන් ප්‍රබන්ධ කර තිබීම විශේෂතාවකි. පසන් පොතෙහි පළමුවැනි දේශනාවට අයත්, පසන් ගීත විමසීමේ දී මවු පුතු දෙපළ මුණ ගස්සවා ඔවුනතර සිදුවන අනුවේදනීය සංවාදයක් කාව්‍යයට නගා තිබීම දැකිය හැකි වන්නේ එබැවිනි. මෙය ශුද්ධ වූ බයිබලයේ කිසි තැනෙක සඳහන් නො වන කතාවකි. සිය පුත්‍රයා මරණය සොයා ජෙරුසලමට යන බව ඇසූ මව ගේ සිතෙහි හටගත් සිතිවිලි කාව්‍යයට නගා ඇත්තේ මෙලෙසිනි.

> මපණ වැනි මගේ කුමාරෙණි අනේ දෙනෙත එළියෙනි මෙනුඹ රඹ ර
>
> මසින නව මස මගේ ගැබ තුළ වඩා බොළඳෙහි ඇකයෙ නා
>
> වසින තිස් අවුරුද්ද වන තුරු තුරුල්ලේ මගෙ ඇති කරපු නුඹ
>
> දකින පමණක් නැතුව ඇරලා කෙලෙස වැවෙමි කුමරු නේ

ගොන්සාල්වේස් පියනම රචනා කරන ලද දුක්ප්‍රාප්ති ප්‍රසංගයෙහි උක්ත සිදුවීම නිරූපණය වන ආකාරය විමසා බැලීම මෙකී පසුබිම වටහා ගැනීමට යෝග්‍ය වේ.

"අයියෝ මාගේ ආත්මය වැනි කුමාරයෙණි, මගේ ඇස් දෙක එළියෙනි, නුඹ වහන්සේ මම නව මසක් මාගේ ගර්භ තුළෙහි වඩා බාල වයසේ සිටින තුරු ඇකයේ බඳවා ගෙන ඇවිද්දෙම් වේද ! තිස් වයසට වැඩිය පැමිණෙන තෙක් මගේ ම තුරුල්ලෙහි ඇති කළෙම් වේ ද ! දැන් මා අත්හැර මගේ රත්තරණෙනි කොතැනට වඩින සේක් ද ! මාගේ සම්පත්ති වූ ඔබ නැති ව මාගේ ප්‍රාණය රැක ගන්නේ කෙසේ ද" (පීරිස්, 1979).

දාරක සම්පත අහිමිවීමෙන් ඇතිවන්නේ මහත් ශෝකයකි. මෙවැනි මනෝභාවයකට පත් වූ කාන්තාවක ගේ ස්වභාවය පිළිබිඹු කෙරෙන අවස්ථා සම්භාව්‍ය සාහිත්‍යයේ ද විද්‍යමාන වෙයි. දඹදෙණි යුගයේ දී රචනා වූ බුත්සරණ කෘතිය මෙහිලා වැදගත් ය. එහි ආභාසය පළමු ව දුක්ප්‍රාප්ති ප්‍රසංගය නම් වූ කෘතියටත්, දෙවනු ව පසන් ගායන සඳහා බලපා ඇති සැටි පෙනෙයි. විද්‍යාචක්‍රවර්තී රචිත බුත්සරණ බණ කතා සාහිත්‍යයේ ප්‍රදීපස්ථම්භයකි (සන්නස්ගල, 1994). එය විලාප ගී සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනයේ දී වැදගත් වන මූලාශ්‍රයකි (වීරක්කොඩි,2021). ධර්මපාල ජාතක කතා පුවත එකී කෘතියෙහි ඇතුළත් එක් කතාවක් වේ (සෝරත,1966). මහාප්‍රතාප රජතුමා විසින් සිය අත දරු බිළිඳා මැරවූ විට රජ බිසව දරු ශෝකයෙන් නැඟූ අඳෝනාව මෙහි දී සිහිපත් වන්නකි (සෝරත,1966).

මේ අතර ජුවාම් නම් වූ ගෝල තෙම තම ගුරු ස්වාමින් වන ක්‍රිස්තුන්වහන්සේට යෙදුණ උපද්‍රා දැක එය උන්වහන්සේ ගේ මෑණියන්ට දැන්වීමට පැමිණියේ ය. ජේසු තුමන් දුෂ්ට වූ ජුදයන් අතට අසු වී කුරුසේ එල්ලා මරන්නට නියම වූ ජේසුතුමන් කුරුසේ කර තබා කපාල කන්දට ගෙන යන බව එහිදී සැල කළේ ය (පීරිස්,1979). මෙය ඇසූ දේවමෑණිය සෝකයෙන්, හඬා වැලපෙමින් පාරේ ගමන් කරන ආකාරය නරඹන්නන් ගේ දෘෂ්ටිකෝණයෙන් ද ඉදිරිපත් කර ඇත්තේ සංකල්ප රූප මවමිනි.

සෝකයෙන් මේ එනා ලිය කව්ද මේ මන් දෝ

ඈ කුසින් බිහි වූ යම් පුත්‍රයෙක් නැසුනා දෝ

මේ මඟින් දැන් ගියේ මරණයට සැදී ඔහු දෝ

ජේසුනන් නසරේනු ලත් මොහුගේ දරුවා දෝ

එහෙමනන් ඒ ලසෝ ගිනි කොහොම උසුලනු දෝ

කී දනන් දේව මව් දැක ඇසුව කොයි යනු දෝ

දූව, පිටිපන ග්‍රාමයෙහි 'අච්චු පසමක්' ලෙසින් උක්ත ගීතය හඳුන්වා තිබේ. මෙකී ගායනය දූව, පිටිපන, වහකෝට්ටේ ප්‍රදේශත්‍රයෙහි ම ගායනා වන පසන් ගීතයකි. මෙකී පසම සඳහා මූලාශ්‍රය වී ඇත්තේ දේශනා නවයේ පසන් පොත බව මෙහිදී නිරීක්ෂණය වූවකි.

අතුරුදන් වූ තම පුතු ගේ රූප ලක්ෂණ, ස්වභාවය පිළිබඳ කියමින්, තම දරුවා දුටුවා දැ යි අසමින්, දාරක වියෝවෙන් මහමඟ ඇවිදින අම්මා කෙනෙකු ගේ සිතෙහි හටගන්නා වූ හැඟීම් පසන් ලෙස කාව්‍යට නඟා තිබේ. වහකෝට්ටේ පසන් ගායන ශ්‍රවණය කිරීමේ දී ලද පහත නිදර්ශනය උක්ත කරුණ තහවුරු කරන්නකි.

ඒ මගේ ශ්‍රී බර වූ කුමරාගේ රූප සැ ටී

මුහුණ මානෙල් මලක් වැනි ජීවමාන සි ටී

මුහුල පෑ ස්වර්ණ සේ කෙදි පාට දිෂ්ටි වැ ටී

ඒ කනා වූ කඳක් සේ ගාත්‍ර මාන අ ටී

පුත් ලොවේ ඒ සමාන වූ අංග රූප ඈ තී

සත්වයෝ නේත්‍ර දෝ දැක ගන්ඩ එහෙම නැ තී

පුත්‍රයා ඒ වගේ නොම දැක්කහොත් පිනැ තී

සිත්තනා ඉන්ඩ බැරි මගෙ දැන්ම ප්‍රාණ ය තී

මරණය කරා ගෙනගිය තම පුතු සොයා දිවයන අම්මා ගේ භූමිකාව කාව්‍යයට නඟන ගොන්සාල්වේස් පියනම එය ඉදිරිපත් කරන්නේ සංකල්ප රූප මවමිනි. ඊට බල පා ඇත්තේ දේශනා නවයේ පසන් පොත ම ය (1948, 41-42). මේ අතර, තම පුතු සොයා යන මව අතරමග දී මදකට නවතින්නේ පාර පුරා වැටී ඇති ලේ දැකීමෙනි. ඇගේ හදවතට දැනුණු හැඟීම් ගද්‍ය කාව්‍යයට නඟා තිබේ.

"අයියෝ ! මේ ලේ කාගේ දෝ ! මගේ කුමාරයාගේ ලේ දෝ ! අයියෝ මාගේ උදරයෙන් ගත් ලේ මේ හැටි පාර දිග ඉසිරී තිබෙන්නේ දෝ ! මාගේ අමෘත කිරි පොවා ඇති කළ ශරීරයෙන් මෙතෙක් ලේ සිඳහෙණු කළ ප්‍රාණය තිබෙන්නේ කෙසේද "(පීරිස්, 1979).

දුඃඛප්‍රාප්ති ප්‍රසඞ්ගය කෘතිය අනුව යමින් දේශනා නවයේ පසන් පොත එකී අනුභූතිය කවියට නගා ඇත්තේ මෙ ලෙසිනි (දේශනා නවයේ පසන් පොත, 1948).

| | |
|---|---|
| දැක බිම පෙරළී ඕගා මේ ලේ කාගේ | දෝ |
| මගෙ කුමාරෙනි මගේ ගර්භයෙන් ගත් ලේ | දෝ |
| ඔබ තුමා ගේ ශ්‍රී ගත තිබුණු ලේ මේ | දෝ |
| අද තමා මෙලෙස පාරේ වැහි මට උනි | දෝ |

| | |
|---|---|
| අනේ අනේ මගෙ කුමාරෙනි කොසෝමද | අයියෝ |
| සැලසුණේ දැන් මෙනුඹහට මොකද මේ | අයියෝ |
| දෙතනිනේ මගෙ කිරි බී ඉනුනු ලේ | අයියෝ |
| මෙලෙසිනේ වැහෙනා කොට පණ තිබේ ද | අයියෝ |

මෙකී පසුබිමෙහි තම පුත්‍රයා ගේ මුහුණ දකින්ට නොලැබේ යැයි සිතා මහත් සේ හඬ හඬා යන දේවමෑණියන්ට වෙරෝනික නම් වූ ස්ත්‍රිය මුණ ගැසේ. ක්‍රිස්තුන් ගේ මුහුණ පිස පිරිසිදු කළ සළුව පෙන් වූ ඇය උන්වහන්සේ ගේ මුහුණ එහි සටහන් ව ඇති අයුරු පෙන්වූවා ය. එය දුටු දේව මාතාව ගේ සිතෙහි ඇති වූ හැඟීම මෙසේ ඉදිරිපත් කෙරෙයි.

“අයියෝ! මගේ කුමාරයනි! මගේ ජීවිතයෙනි! මගේ රන් ආභරණෙනි! මේ ඔබගේ ශ්‍රී මුහුණදෝ! දිව්‍ය කාන්තියෙන් දිලිහි දිලිහි තිබුණේ මේ මුහුණදෝ ! චන්ද්‍ර සූර්‍ය්‍යා පරදවා තිබුණේ මේ මුහුණදෝ! සුරලොව ඇත්තන් ප්‍රීති කරවා දුටු දුටු වේලෙහි මා සතුටු කරවා තිබුණේ මේ මුහුණදෝ! අයියෝ! මාගේ රම්බර කුමාරයෙනි කවුරු ඔබට ගාවිනා කෙළේ ද, කවුරු නුඹේ සියලු රූප ස්වාභා මකා මෙලෙස අවලක්‍ෂණ කළේ ද කියා පිරිසිදු දේවමෑණියෝ විලාප කියා කියා”(පීරිස්, 1979).

එකී ගද්‍ය කොටස පසන් කාව්‍යයක් බවට පත් ව ඇත්තේ අපූර්වත්වයකිනි. මේ පසන් ගායනය දේශනා නවයේ පසන් පොතෙහි ඇතුළත් වන්නකි (දේශනා නවයේ පසන් පොත, 1948). වහකෝට්ටේ දී උක්ත පසම ඍෘතාරික සමයේ දී ගැයෙන්නකි.

| | |
|---|---|
| මාගෙ ශ්‍රී කුමාරෙණි මගෙ ජීවිත වූ | පුතුනි |
| මාගෙ රම් බරණයෙනි මගෙ ස්වාමි වූ | පුතුනි |
| මාගෙ මේ මුණ ශ්‍රියා දුන්නු මගේ | පුතුනි |
| වාගෙ මේ නුඹේ මුව කෙලෙසුණා දෝ | පුතුනි |

ඉන්ද්‍රීලේ දිලිහී තිබුණු මුව මේ දෝ

චන්ද්‍රසූරියා පරදා තිබුණු මුව මේ දෝ

මණ්ඩලේ මොක් දනන් තුටු කරපු මුව මේ දෝ

පෙම්වඩා මාව නිති දැක පැවූ මුව මේ දෝ

ගොන්සාල්වේස් පියතුම විසින් රචනා කරන ලද ‘දුඃඛප්‍රාප්ති ප්‍රසඞ්ගයෙහි අභිනව කාව්‍ය ප්‍රබන්ධය හෙවත් දුක් ප්‍රාප්ති ළතෝනි’ පොතෙහි ඉහත පසන් රචනය ඇතුළත් වන්නේ පසන් පොත ආභාසයෙන් බව හඳුනාගත හැකි වේ (1936 : 14,43).

කුමරාණෙනි මගෙ ජීවිතදානෙනි රන්, බරනෙනි සමි දෝ - ඔබගේ

අජරාමර වූ සුසිරා වනදිව, සපුරා මුවමේ දෝ - ඔබ

එසුරා ශ්‍රී කැන් සපුරා දිලිසෙන, අරාදිතමුව දෝ - සෝම

බසුරා පරදා සුවීරා ජිතවන, රුබරා මුවමේ දෝ - සෝම

අයියයියෝ මගේ කුමරුණි, මගේ ජීවිත රන් ආබරණෙනි

අයිඅයියෝ ඔබගේ මුව මේදෝ - පුතුනේ

අයියයියෝ දිව්‍ය ශ්‍රීකැන්, දිලිහි දිලිහි වැඩූ දිසිමත් අයියයියෝ

එවන් මුව මේදෝ - පුතුනේ

අයියයියෝ ලෝක දිසිදෙන, උලිඳුදින මඩලත් පරදා, අයියයියෝ

තිබුණු මුව මේදෝ -පුතුනේ

අයියයියෝ සුරේජනහට, පිරියකරවා මා සතුටුකර,

අයියයියෝ තිබුණු මුව මේදෝ - පුතුනේ

තම පුතු ගේ මුහුණ ලාංඡන සිඹ සිඹ සිටින කල්හි මේ සැටි ප්‍රමාද උනොත් පුත්‍රයා පණපිටින් දකින්ට බැරිවෙයි කියා ‘වෙරෝණිකා’ කී හෙයින්, ඇය තම පුතු දැකගැනීමට මහත් සේ කඩිනම් කර ගමන් කරන්නී ය. එවිට දුර සිට ඇසෙන වදබෙර ශබ්දය අසා වේදනාවෙන් හඬමින් තම පුතු සියැසින් දැකගැනීමට ඉදිරියට ම ගමන් කරන්නී ය. මේ අතර, අම්මා ගේ සහ පුතා ගේ නෙත් එකිනෙක ගැටේ.

“ඉරත් සඳත් ඉදිරිකොට සම්භවී ග්‍රහණ වුණා සේ ද වැසි පිරුණු මේඝවල් කළු වුණා සේ ද දෙදෙනා වහන්සේලා ගේ මුහුණු මණ්ඩල කළුවර වැසී නේත්‍රවල කඳුළැලි පිරී දෙනොගේ හෘදවල් දෙකෙහි කඩුමුණු දෙකක් ඇනුනාසේ දුක්වේදනාවෙන් එක වචනයකුත් කථාකරන්ට නුපුලුවන්ව මහා වර්‍ෂා වතුරසේ පොළවෙහි ගලන්ට ශ්‍රී නේත්‍රවලින් කඳුළු වාසින්නේ ය. ඒ නිසා මෙවැනි දුක් සන්තාප ගැඹුරෙහි මහත අහස පොළවෙහි ඇති සියලු භක්ති ආත්මයන් විමසා පොළවෙහි ඇති සියලු භක්ති ආත්මයන් විමසා කියතත් නියමකරන්ට පුළුවන් දේ නොවී ඒ දුකින් මෑණියන්ගේ ප්‍රාණ සැඟවෙන ආකාර තුබුණයි කියා ඥානවන්තයෝ කියන්නෝය. මෙබඳු දුක් ගිඤරින් දේවමෑණියන් කුමාරයා ගේ ශ්‍රී ගතෙහි වැසෙන ලේ ධාරාවල් අතින් පිස පිස කඳුළුවලින් නාව නාවා

සිටින තැන ඒ දුෂ්ට වධකරුවෝ ප්‍රමාද වෙතැයි කියා මහත් වූ රොසයෙන් මෑණියන් ගේ තුරුල්ලෙන් පුත්‍රයා උඳුරා එක වැරන්ම ඇදගෙන නුවර වාසල් දොරකඩින් පිටත් කරන තැන අප

ගේ ස්වාමිදරුවෝ කුරුසේ එක්ක දෙවනුත් මුණින්තලා වැටී ප්‍රාණය සැඟවුනා සේ හුස්ම සලකුණක්වත් නැතුව උන්සේක"(පීරිස්, 1979).

එහි දී මතු වන හැඟීම පසන් ගීතය තුළ ප්‍රතිනිර්මාණය කරන්නේ මෙලෙසිනි. වහකෝට්ටේ ගැයෙන මෙම පසන් ගීතය සඳහා පසන් පොත මූලාශ්‍රය වී තිබේ (දේශනා නවයේ පසන් පොත, 1948).

| | |
|---|---|
| පුත්‍රයත් මෑණියන්ගේ මූණ දැකපු ස | දේ |
| මාතෘවොත් සිය පුතුන් ශ්‍රී මූණ දැක්ක ස | දේ |
| සිත් දෙකේ දෙන්නාටවත් සෝක ගින් ලෙ | දේ |
| පුත් ලොවේ කියන්නට නැත උපාවක් එම | දේ |
| | |
| බානු පුත් සඳට සම්භව රාහු පත්වුනු | සේ |
| මේසයෙන් වලා මග කළු කරපු වැසි දුම | සේ |
| දෝ උවන් ක්‍රිස්න වී සිලිලාර නේත්‍ර වැ | සේ |
| ලා සුසුන් වැලපුණා මිස දෙන්න දුටු විලසේ | සේ |

මරණය කරා ගෙන යන පුත්‍රයා ගේ සහ මව ගේ මුණ ගැසීම බලා සිටින නරඹන්නන් තුළ පවා ඇතිවන්නේ සංවේදී හැඟීමකි. ගොන්සාල්වේස් පියනම එකී ප්‍රස්තුතය දුඃඛප්‍රාප්ති ප්‍රසඞ්ගයේ ඉදිරිපත් කර ඇත්තේ නාට්‍යෝචිත වන පරිදි ගද්‍ය ආකෘතියෙනි.

"අයියෝ ! දුක්හරිත මෑණියනි ඔබ ගේ පුත්‍රයා ගේ ජීවිතය නැතිවෙනවා දැක ඔබ ගේ ජීවිතය තිබේද? මෑණියොත් පුත්‍රයාත් දෙදෙනා අද එකදුක් සමුද්‍රයෙහි ගිලී සිටින්නාහුවේද, අයියෝ ක්‍රිස්තියානිවරුනි අද මෑණියන් දෙස බලා අඬමුදෝ? පුත්‍රයා දෙස බලා අඬමුදෝ ? පුත්‍රයා ගේ දුක් වැඩිය කියමුදෝ, මෑණියන් ගේ ශෝක වැඩිය කියමුදෝ, කාගේ දුකට සැනසීම කියමුදෝ පුත්‍රයන්වහන්සේ අති බර කුරුසේ කරපිට උසුලා ඉන්නසේකැයි කීවොත් ඒ බර මෑණියෝ සිතෙහි උසුලා ගෙන ඉන්නාහ. පුත්‍රයාණන් වහන්සේ ගේ මස්තකයේ උග්‍ර කටටුඔටුන්නක් ගසා වැදී තිබෙන්නෙයි කීවොත් ඒ කටු සමාන උග්‍ර වේදනා මෑණියන් ගේ සිතෙහි වැදී තිබෙන්නේ ය. පුත්‍රයා බැඳුම්කා ඉන්නෙයි කීවොත් මෑණියන් ගේ සිතේ ඇති ආදර බැම් කැක්කුම් වන්නේය. පුත්‍රයා ගමන් ගැහැනියත් හතිකැක්කුමත් තදෙයි කීවොත් මෑණියන් ගේ ශෝක කාංෂාවලුත් ඇඬුම් සුසුම්ලෑම්වලුත් එලෙස දැඩිවේය. පුත්‍රයාණන් වහන්සේ බලගතු වසක්කේඩුවෙන් වැටී ඉන්නසේකැයි කීවොත් මෑණියන්වහන්සේ අති බර අකම්පාලයෙන් ඉන්නාහ. පුත්‍රයන්වහන්සේ නිඳා නිසරු විඳිනසේකැයි කීවොත් පුත්‍රයා ගේ සියලු නිඳා අවමාන්න මෑණියෝ විඳින්නාහ. පුත්‍රයාට පහර ගසා වදකර ගෙන යන්නෙයි කීවොත් ඒ සියලු පහරවල් මෑණියන්වහන්සේ ගේ සිතෙහි වදින්නේය. ඒ සියලුම වද උන්වහන්සේට කැක්කුම වන්නේය. අයියෝ දයා ඇති ක්‍රිස්තියානිවරුනි, මෙලෙස පුත්‍රයා ගේ දුකට මෑණියන් ගේ දුක අඩුනොවෙයි. පුත්‍රයා කරින් ගෙනියන කුරුසේ මෑණියන්වහන්සේ සිතින් ගෙන යන්නාහ. ඒ නිසා අද දෙදෙනා වහන්සේලාට සැලසීම කියන්ට ඕනෑය. දෙදෙනාවහන්සේලා ගේ දුක කොයියාකාරයෙනුත් ලේහු කරන්ට ඕනෑය. පුත්‍රයා ගේ දුක ලේහු වුණොත් මෑණියන් ගේ දුකත් ලේහුවෙයි. ඒ නිසා අපි සියලුදෙනා අද අපගේ ස්වාමිදරුවන්වහන්සේ ගේ දුක් ලේහුකරන්නට වෑයම් කරමුව. ඒ කෙසේද කීවොත් උන්වහන්සේ ගේ කරේ තිබෙන කුරුසේ බර සියල්ල

අපගේ පව්බර නිසා අප ගේ පව්බර අඩුකළොත් ඒ කුරුසේ බර අඩුවේ ය. අපගේ පවු වැඩිවුණොත් ඒ බර වැඩිවෙයි. ඒ දැක අද අප ගේ සියලු පාප අපි දවා නැතිකර දේවමෑණියන් සමගත් මරියමග්දලේනා සමගත් අඬා අඬා සිමන්සිරිනෙවු ගෙනගිය කුරුසේ හුලහක් අප ගේ කරේ තබාගෙන ස්වාමිදරුවන් ගේ ගමන් පස්සේ යමුව. අයියෝ මගේ ස්වාමිදරුවනි! මෙලෙස අද ඔබ ගේ කුරුසේ සරණ අප විසින් ගන්ට ඔබ ගේ දුක්හරිත සිරි මුහුණ මණ්ඩලය අපට පෙන්වා වදාරණවා සොඳේ"(පීරිස්, 1979).

උක්ත අත්දැකීම පද්‍ය ආකෘතියට අනුව පසන් ගායනාවක් බවට නඟා ඇත්තේ කරුණ රසය මතුවන පරිද්දදෙනි. වහකෝට්ටේ ගැයෙන මේ පසන් ගායනය සඳහා දේශනා නවයේ පසන් පොත ඉවහල් කර ගෙන තිබේ (1948: 48).

ගුණ වත් මව දැක අඬමු දෝ

සුත සිය බලමින් අඬමු දෝ

සැනසුන් කාහට කියමු දෝ

වෙන කොයි ලෙස අද කරමු දෝ

මවුගේ දුක වැඩි කියමු දෝ

පුතුගේ දුක වැඩි කියමු දෝ

කාගේ දුක වැඩි කියමු දෝ

මෙවගේ කාහට කියමු දෝ

මෙහි දී දැක ගත හැකි විශේෂතාවක් වන්නේ ලාංකේය ජන සාහිත්‍යයේ ආභාසය මෙකී කාව්‍යය උදෙසා බල පා ඇති බවකි. මෙහි දී ජන ගායන සම්ප්‍රදායෙහි එන කාව්‍ය කිහිපයක් සිහිපත් වේ. ඉන් එකක් වන්නේ පන්සිය පනස් ජාතක පොතෙහි සඳහන් "නිග්‍රෝධ මිග ජාතකය" මූලාශ්‍රය කොට ජන කවි සම්ප්‍රදායට අනුව රචනා වූ "මුව ජාතක කාව්‍යය"යි. එය සෙංකඩගල අවධියේ රචනා වූවකි (සන්නස්ගල, 1994). රජුට මස් පිණිස දන්ගෙඩියේ ගෙළ තැබීමට නියම වූ ගැබ් ගත් "මුව දෙන ගේ වැලැපුම" කවි 13 කින් යුත් අඳෝනාවකින් යුත් කවෙකි (වීරක්කොඩි,2021). එහි ඇතුළත් කාව්‍ය දෙකක් පහත දැක් වේ.

දුකසේ මම ලත් දරුවෝ

කෙළ කෙළ එන්නං සරුවෝ

සුරතල් දැක සිත් පිරුවෝ

විගසින ආවයි මරුවෝ

උරා තනේ කිරි කවදා පොවන් දෝ

දරා මගේ සිත කෙලෙස ඉඳින් දෝ

නුරා කරන සුරතල් නුදුටින් දෝ

පුරා තැනක කළ පවු පල දුනි දෝ

හත්කෝරලය උඩු නුවර, යටි නුවර සහ හාරිස්පත්තුව ඇතුළු උඩරට ප්‍රදේශයට අදාළ වූ කොහොඹයක් කන්කාරිය ශාන්තිකර්මයෙහි කාව්‍ය දෙවැනි අවස්ථාවයි. උඩරට නර්තන සම්ප්‍රදායේ කෝෂ්ඨාගාරය ලෙසින් හැඳින්වෙන මෙකී ශාන්ති කර්මයෙහි අන්තර්ගත වන කතා පුවත් කිහිපයක වැළපුම් ගායන හඳුනාගත හැකි වේ. එහි එක් පෙළපාළියක් වන 'පලවැල දානය' හි ඇතුළත් කාව්‍ය දෙක මෙසේ දැක්විය හැකි ය (ගොඩකුඹුරේ, 1963).

මද මත් ගජ ලිහිනිය දෝ

තද පද යන රකුසෙක් දෝ

පද මක් තුති විස නසි දෝ

අද වත් කුමරුන් කොහෙ දෝ

වනයේ වෙසෙන දෙවියෙක් දෝ

අනේ තමා උන් දුටි දෝ

වනයේ රකුසු යෙන ගිය දෝ

අනේ කුමන මායම දෝ

කොහොඹායක්කාරිය ශාන්ති කර්මයෙහි ඇතුළත් කුවේණි අස්න වැලැපුම් සම්ප්‍රදාය අධ්‍යයනයෙහි වැදගත් තවත් මූලාශ්‍රයකි (වීරක්කොඩි,2021). එය ලක්දිව රජකම් කළ පඬුවස් දෙව් රජුට කුවේණිය විසින් කළ දිවි දෝෂය පහ කිරීම සඳහා කළ චිත්තාකර්ශණීය නැටුම් විශේෂයකි. එහි ඇතුළත් ගායනා කිහිපයක් ද ඉහත පසන් ආකෘතිය විමසීමේ දී ප්‍රත්‍යාවලෝකනය වන්නකි (කුවේණි අස්න, 1886).

අහෝ මේ කිමෙක් දෝ

කුසුම් තුරු පල දෙ දෝ

මගුලුයන නස දෙ දෝ

මෙලෙසකා ඇවිදෙ දෝ

මහත් ඇත් රැලෙක් දෝ

නොහොත් ගිරි පෙළෙක් දෝ

දුටු කෙනෙක් නොමැද් දෝ

නිරිඳු හට කියද් දෝ

දුටොත් මා තිබෙද් දෝ .

ඉහත සඳහන් පසන් ගායන සඳහා විවිධ ජන මූලාශ්‍රය ආභාසය ලද බව එකී නිදසුන්වලින් පෙනෙයි.

දුඃඛප්‍රාප්ති ප්‍රසංගයේ (62-63) කුට ප්‍රාප්තිය වූ කලී නවවැනි දේශනාවෙහි එන මරිය මව්තුමිය ගේ කන්නලව්ව ය. දේශනා නවයේ පසන් පොතෙහි නවවැනි දේශනාව පුරා අම්මා ගේ වැලැපුම දැකිය හැකි ය. එය ලාංකේය විලාප ගායන සම්ප්‍රදායට නව මානයක් ලබා දෙන බව හඳුනාගත හැකි වීම විශේෂතාවකි.

ලෝ සත රකින කරුණා වෙ නී

පූජිත වූ සුර බවනෙ නී

ඒ කළ වද සැටි පෙනී පෙ නී

ජීවිත නෙතිබෙයි මෙ දුකි නී

රන් රුව ලෙස දෙව් කුමරු ටා

උන් සිත රොසින් දෙන පාර ටා

ගත් හෝ තිරෙයි ලේ යෙන්ව ටා

දැන් ඒ දැක බැරි වැවෙන්න ටා

නන් වාසි කියා සුකර සු රේ

දැන් රෝසි වෙලා වදකොට ත රේ

ඉන් රාසි දනන් සෙන් ඒපු රේ

උන් රැසියන්සේ ඇඬු නොම සැරේ

තළ තළා කුමරු හට කළ ව දේ

බල බලා එ මව් ඉස අත් බැ දේ

සල සලා කඳුළු ඉකි බිඳ බි දේ

පුල පුලා අඬති මව් වැඳ ත දේ (වහකෝට්ටේ, 2015).

මෙකී කාව්‍ය සඳහා ජන සාහිත්‍ය සම්ප්‍රදායහි ප්‍රකට කාව්‍ය ග්‍රන්ථයක් වන ‘වෙස්සන්තර කාව්‍ය’ ආභාසය ද මෙහි දී දැකිය හැකි වීම විශේෂතාවකි. 'තළ තලා කුමරු' පසන් කාව්‍ය සමඟ පහත වෙස්සන්තර කාව්‍ය විමසා

බැලීමෙන් එය තව දුරටත් පැහැදිලි වන්නකි (වෙස්සන්තර ජාතක කාව්‍ය: 318, 322 කව) (සිතියම් සහිත පුරාණ වෙස්සන්තර ජාතක කාව්‍යය, 1975:22)

පෙමින සොඳින් හොඬ වෙල වෙලා

අත් පිඹිනෙ හඬින් හඬ තල තලා

ඇත් පැටි පැටවුන් රඟ බල බලා

යෙත් එබෝසතුන් සිත තුටු වෙලා

රුළ පන්නා උකු තල තලා

තඑ ලෙළව නොමින් දත් පුල පුලා

පැටව් සමඟ වන කෙළ කෙළා

සිටි ඌරො එවන යෙති බල බලා

මානව විද්‍යාව, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව සහ සංස්කෘතික අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍රයන්හි යෙදෙන මූලික මාතෘකාවක් ලෙස "මරණය" කෙරෙහි මිනිසා දක්වන ආකල්ප බොහෝ කලෙක සිට අධ්‍යයනයට ලක් ව තිබේ. වියෝව, වෙන්වීම, මරණය, අහිමිවීම යන කරුණු ඇසුරෙන් ඇති වන්නා වූ ශාරීරික සහ මානසික සංකූලතා විවිධ ජන කොට්ඨාස තුළ විවිධ සංස්කෘතිකමය පරිසරයක් ඔස්සේ ගොඩ නැගුණකි. තම පුතු ගේ මරණය පිළිබඳ මවු කෙනෙකු ගේ හදවතෙහි පැන නඟින සිතිවිලි සමුදායක් ගද්‍ය - පද්‍ය ආකෘතියට අනුව පසන් ගායන තුළ නිර්මාණය ඇත්තේ දුක පිළිබඳ ප්‍රකාශනයක් ලෙසිනි. එකී ප්‍රකාශනය විවිධ ආකෘතියෙන් ඉදිරිපත් වනු වර්තමාන සමාජයෙහි ද දක්නට ලැබේ. ගොන්සාල්වේස් පියතුමා දුඃඛප්‍රාප්ති ප්‍රසඬ්ගය ගද්‍ය කාව්‍යයෙන් ද අම්මා කෙනෙකු ගේ දුක ඉදිරිපත් කර තිබේ. එකී කාව්‍ය පරිශීලනය කිරීමේ දී ජන කාව්‍යයක් වන යසෝදාවත ද සිහිපත් වේ.

වසිනා වැසි හුමි නෙත් කඳුළෙන් මම නෑ මි

දකිනට කොතනක යාමි වැඩි තැන නැතුවම හු මි

යත්දී අත් හැරලාමි මමත් එමැයි පැවසී මි

අත් නොහැරම මම ආමි ඉන් දැන් කෙලසක වා මි

සෙනෙහස ඇතුව මෙමාසේ වෙන කවුරුත් නැත බෝ සේ

මා අත් හැරලා මෙලෙසේ වැඩියාදෝ උඩ අහ සේ

වරද නැතුව කිසි දොස් වදකරවති තද රෝ සේ

ලලා සිය දාසේ උසුලම් මේ දුක් කෙලෙ සේ

මා ඇති සෙනහසේ මේ ඔබත් මෙමට ඇති ප්‍රේ මේ

වෙනස නොවී සැමදා මේ ඔබ තනි නොකරම ආ මේ

අසුව මෙවද වින්දා මේ පෙන්නු මවිතය සේ මේ

තෙද අන සක ඇති නාමේ ඇරලා කෙලෙසක වා මේ

වැලැපුම යනු තමන්ට හිතවත් හෝ වැදගත් අයෙකු අහිමිවීම හෝ මරණය තුළින් යම් පුද්ගලයකු දක්වන්නා වූ සමාජ චර්යාවකි. එහි භාවමය ප්‍රතිචාරය වන කනගාටුව, කම්පාව, ඛේදය, තැවුල, දුක, ශෝකය, විෂාදය යනාදිය ප්‍රකාශනය අම්මාගෙ වැලැපුම මඟින් කාව්‍යට නඟා ඇත්තේ මෙසේ ය (දූව, 2017).

රන් මැණික මෙන් ලගේ උනනු මගේ පුත්‍රනි

දැන් නුඹට මෙහෙම දුක් උනි දෝ //

පින්බර වූ මන් සෙනෙහෙ වන්ත පුතුනී

ලංකාරවල් නුඹගේ දැන් කොයි දෝ //

ඉන් ප්‍රිලෝ සුයම්බු දෙවු පෙම් බර වූ ඥානෙනි

උන් දේව සුරිඳු වන සුන්ද්‍ර දෙව් රජී දෝ //

මන් ලෝක තුංග දෙව් රාජ ගොතිරෙනි

වන්සේ සුරංගි රජ ඔබ නෙවෙ දෝ //

මීගමුව දූව ප්‍රදේශයේ ප්‍රචලිත ඉහත පසන් ගීතය දූව පසන් කණ්ඩායම හඳුන්වන්නේ ‘අත් අකුරු පසන්’ වර්ගයක් ලෙස ය. එම ගායනාව ‘ළතෝනි ’නමින් ද හඳුන්වා තිබේ. දේව මැණියන් ගේ වැලැපුම ළතෝනි නමින් හඳුන්වන බවත්, එකී ගායනාව පාරම්පරිකව පැවත එන බවත්, එකී ගායනාවෙහි කතුවරයා නිර්නාමික බවත් විශ්වාසය වේ. එසේ වුව ද පසන් ගායන පිළිබඳ මෙම අධ්‍යයනයේ දී හෙළි වූයේ එය ජාකොමේ ගොන්සාල්වේස් පියනම රචිත පසන් ගායනාවක් බව ය (ළතෝනි,1936). ‘දුඃඛප්‍රාප්ති ළතෝනි’ නම් වූ අප්‍රකට කෘතියෙහි ආභාසය පසන් ගායන කෙරෙහි බල පා තිබේ. මේ නිසා පසන් ගීතය තුළ ළතෝනි නමින් ප්‍රභේදයක් ඇති බව පෙනී යන්නකි. පසන් ගායන පිළිබඳ පර්යේෂණයක නියැළුණු සුනිල් ආරියරත්න ඒ පිළිබඳ දරන්නේ මෙවන් අදහසකි.

> “ළතෝනි” යන පදය පසම් යන ව්‍යවහාරිකය සමග නිතර භාවිත වනු අසන්නට පුළුවන. ඒ වූ කලී පසම් යන පදය සිංහල කරගන්ට දැරූ වෑයමක් දැ යි බැලූ බැල්මට පෙනී යන නමුදු ළතෝනි සහ “පසම්” යනු රචනා දෙවර්ගයක් බව වැඩිදුරටත් කරුණු විමසන කල පෙනේ. පොදුවේ බොහෝ දුඃඛප්‍රාප්ති ගායනා හැඳින්වීම සඳහා “පසම්” යන පදය යොදා ගෙන ඇති අතර, දේව මැණියන් විසින්

ගායනා කරනු ලබන වැලපුම් ගී සඳහා "ළතෝනි" යන විශේෂ පදය යොදා ගත් බව පැහැදිලි ය (ආරියරත්න, 1987).

ඉහත කරුණු අනුව පසම් හා ළතෝනි පිළිබඳ ගැඹුරින් විමසා බැලීමේ දී එම ගායන නම් දෙකකින් හඳුන්වා තිබුණ ද එක ම අරමුණක් උදෙසා, එක ම කාල වකවානුවක ගැයෙන්නක් බව පෙනීයන්නකි. තව ද ක්‍රිස්තුන් ගේ දුඃඛප්‍රාප්තිය නම් වූ කිතුනු සංකල්පය ශ්‍රී ලාංකේය සමාජයේ ජන හදවත්වල ගැඹුරින් තැන්පත් කිරීමට යෙදූ කාව්‍ය උපක්‍රම දෙකක ග්‍රන්ථ දෙකක් බව පෙනී යන්නකි. එනම්, ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා විසින් 'දේශනා නවයේ පසන් පොත' මෙන් ම 'ළතෝනි' නමින් යුත් ග්‍රන්ථයක් ද සම්පාදනය කර ඇති බවකි. 'ළතෝනි' නමින් යුත් ගොන්සාල්වේස් පියතුමා විසින් රචිත කෘතිය මෙතෙක් අධ්‍යයනයට පාත්‍ර නොවූවකි. දුඃඛප්‍රාප්තිය ජනගත කිරීම මෙකී කෘති ද්විත්වය හරහා සිදු කළ අතර, එක් ප්‍රබන්ධ වර්ගයක් පසන් ලෙස ද අනෙක ළතෝනි ලෙස ද හැඳින් වූ බව පෙනී යන්නකි.

ජාකොමේ ගොන්සාල්වෙස් පියනම විසින් නිර්මාණය කරන ලදැයි සැලකෙන 'වේද කාව්‍යය' වර්ෂ 1725 දී රචනා වී තිබේ (වැලිකඩආරච්චි, 2006). 'දෙවු මවු වලප' නමින් දේශනා නවයේ පසන් පොතෙහි ඇතුළත් ගායන කෙරෙහි ඊට පෙරාතුව රචනා වූ වේද කාව්‍ය ආභාසය වී ඇති බව දැකිය හැකි වන විශේෂතාවකි. පහත දැක්වෙන පද්‍ය සඳහා වේද කාව්‍යය ඉවහල් වී තිබේ (පීරිස්, 1979).

| | |
|---|---|
| පිනි බිඳුවන් සුදු පෑ ඉතා බඳු වදමල් පෙති වෙනි ර | තා |
| මෙදෙකින් ඔප වැඩි උවනතා දුටුවන් තුටුකරවන සි | තා |
| දුක් වින්දේ ජුදයින් අතා පවින් මුදම්මැයි ලොව ස | තා |
| සුන් බුන් කැළලක් වැනි ගතා ඉන් දැන් වැවෙනු බැරි ඉ | තා |
| | |
| ඉඳු නිල්මිණි පැහැයෙන් සොඳේ බබලන යුග නුවනත ත | දේ |
| දුටු දුටුවන් සිත ලොබ බැඳේ මනනද කරවන හැම ස | දේ |
| දැක දැක ඔප වැඩි රන් කඳේ වද කරවූවේ ඇයි ත | දේ |
| අත් ඇරලා මගෙ ගුණ කඳේ කෙලෙසක වැවෙම්දෝ අ | දේ |
| | |
| උවනත බඳුවද දුල්ලා දැක වඩවන සිත ලො | ල්ලා |
| එවෙනි සුබාවත නිල්ලා වැගිරෙයි ලේ ගඟුලැ | ල්ලා |
| ගුණ ඇති සතුරෝ ගොල්ලා වදකර මැරුවේ එ | ල්ලා |
| දකිමින් මෙහැම සියල්ලා වැවෙනු බැරි විය වු | ල්ලා |

වරලස රන් කෙඳි වැන්නේ ඔප වඩමින් දිලිසෙ න්නේ
තුන් ලොව සියලු සතුන්නේ මෙත් සිත් ලොබ වඩව න්නේ
කටු ඔටුනුත් ගෙන උන්නේ සිරස වසා ගවස න්නේ
මේ දුක් දැක කුමරුන්නේ කෙලෙස ද මම වැවෙ න්නේ

නව මස ගොසින් වදාලා වැඩුණේ රන් කිරි බී ලා
මුඛයෙන් රස බස් දීලා තුතිවන සුරතල් පෑ ලා
මේ ලෙස වද කරවාලා සොඳ දෝ දැන් මරවා ලා
මසිතට තද දුක් දීලා පව් අරගති ජුදයා ලා

සුර විමනේ වැඩ ඉඳලා සව් සත රකිනට ලොබ ලා
නරලොව සපැමින එකලා නොයෙක් අරුම යස පා ලා
තර කොට කුරුසේ බැඳලා කරණ වදට සිත සැක ලා
මරණට පත් රඟ දැකලා අඬති දිනිති දුක් වැදි ලා

බඳ පිට දිලි රන් පෝරුවේ උවනත පිරි සඳ සේරු වේ
කොඳ නද කරවන ඒ රුවේ වද කොට කරවති මැරු වේ
බැඳ අත් පා ඇණ තෙරපුවේ තලා දෙපස අත් මාරු වේ
සොඳ දෙව් කුමරුව මැරුවේ අඬති එ මවු නොම ආරු වේ

මාන උතුම් දෙව් සුරනා  පාන යසස් බල නොදැ නා
ඊන ජුදෙව්වෝ මෙදිනා කරන වදය දැක තදි නා
වාන දුකක් නො ව  මෙදිනා කෙසේ ඉඳමි දිවි රැගෙ නා
දාන එමවු කුස දුකිනා අඬති පෙරලෙමින් දෙර නා

සරණ වෙලා හැම සව් සතා රකිනට වැඩි දෙව් මෙදියතා

උරණ වෙලා සත නොනැවතා කරති වදය දොඩමින් මැ තා

කිරණ දිලිසෙන ශ්‍රී ගතා දැක දැක වැවෙද මගෙ සි තා

දෙරණ ඉතිරි කඳුළැලි ගතා අඬති වැනෙති මවු දස අ තා

පෝසත් සුර පුරයෙන් ලසේ ලෝ සත් රකිනට වැඩ මෙ සේ

රූපත් සුර කුමරුව රොසේ අසුකර ජුදයෝ එවිග සේ

ඒ අත්පා බැඳ දස දෙසේ කරපු වදෙන් පණ ගිය ල සේ

මා අත්හැර වැඩු කල මෙසේ කිකල නිවෙද ගිනි මවු කු සේ

මෙරට විවිධ ප්‍රදේශයන්හි ප්‍රසිද්ධියට පත් පසන් ගීතයක් ලෙස ‘සුර ලොවිනේ ’පසන් ගීතය හඳුනාගත හැකි වේ. එය කළුතර දිස්ත්‍රික් කතෝලික ප්‍රජාව අතර ද, පුත්තලම දිස්ත්‍රික්කයේ ද එකසේ ජනප්‍රිය වූවක් බව දැකිය හැකි ය. එමෙන් ම වහකෝට්ටේ ප්‍රදේශයේ දී එය වෙනත් තනුවකින් ගායනා කෙරේ. උක්ත පසන් ගායනය දේශනා නවයේ පසන් පොතෙහි මෙන් ම වේද කාව්‍යයෙහි ද ඇතුළත් වන්නක් බව පෙනෙයි. පසන් ගායන අතර ඉමිහිරි පසන් ගීතයක් ලෙස මෙකී පසන් ගායනය සැලකිය හැකි වේ.

සුර ලොවිනේ බැස මෙදිනේ මවු කුසිනේ බිහි වෙමි නේ

කුඹු දෙතනේ කිරි බොමිනේ මිනි ලෙසිනේ වැඩුණු තැ නේ

දිලෙන රනේ රුව ලෙසිනේ මල් උයනේ සිටිය දී නේ

මේ මරණේ ඔබට උනේ කිමද අනේ සුර රජු නේ

රන් කෙඳි සේ වරල දිසේ රන් රඹසේ ගහන රැ සේ

නිල් මිණි සේ සොබන ඇසේ සවන දිසේ විදුලිය සේ

රන් රුවසේ ගත වෙනසේ රුසිරු මෙසේ අසන ලෙ සේ

මෙපන ලෙසේ ගිය විලසේ හැම දවසේ වාමි කෙ සේ

නිති සොබනා රුසිරු මෙනා මෙ ඔබ විනා කවුද වෙ  නා

දිවි දලිනා ඔබ වඩනා දිලෙන රනා රුව ලෙසි  නා

සියලු දනා සතුටු වනා මියුරු වනා රස බසි  නා

සුර වරනා දිවි රැගෙනා පව් බිඳිනා ගියෙ මෙදි  නා

සොබන විලේ මල් උපුලේ කමළු පුලේ දෙනෙත දි  ලේ

සිත ඇතුළේ ලොබ නොකළේ මෙනුඹ ලොලේ මෙවියවු  ලේ

මෙ සක්වලේ තෙදන බලේ පෑපු කලේ පෙර එක  ලේ

දැන් මෙකලේ මෙපණ නලේ නැති අසලේ කින්ද ප  ලේ

රන් ගිරසේ දෙරණ රුසේ නො දිලිසේ නිතර දි  සේ

ගුවන් කුසේ දිලි සඳසේ හැම දවසේ සමඟ වැ  සේ

රන් රසසේ නොම වෙනසේ එක පනසේ සැම දව  සේ

මපණ ලසේ ගිය විලසේ දැක මෙලෙසේ වාමි කෙ  සේ

ඉහත 'සුරලොවිනේ ' පසන් ගීතය විමසීමේ දී වෙස්සන්තර කාව්‍ය එන 671 කව සිහිපත් වන්නකි. එය පහත ලෙසිනි (සිතියම් සහිත පුරාණ වෙස්සන්තර ජාතක කාව්‍යය, 1975).

දෙතනේ කිරි බොමිනේ කළ සුරතල් සිහිවෙමිනේ

උදුනේ ගිනි ලෙසිනේ ඇවිලෙන්නයි කුස තුළිනේ

වචනේ තුත් නුදුනේ තව කිම්දැයි  නරනිඳුනේ

මෙවනේ තනිවෙමිනේ ඔබ ඉන්නට වෙයි ඉතිනේ

මෙහි සඳහන් පසන් ගීත සූවිසි මත් විරිතට අනුව නිර්මිත ව තිබේ. මෙකී ඇතැම් පසන් ගීත අම්මා ගේ මුවින් ගැයෙන්නේ නැළැවිල්ලක ආකාරයෙනි. ජන සම්ප්‍රදායෙහි එන නැළවිලි ගීත දොළොස් මත් විරිත අනුව සැකසී තිබේ. එවැනි නැළැවිලි ගීත ද මෙහි දී සිහිපත් වේ (වීරක්කොඩි, 2015).

රැබර මගෙ පුතණුව  නේ

ගෝමර හැම තැන ඉසු  ණේ

නාඹර මගෙ කිරි දෙත  නේ

කිරි බීපන් පුතණුව  නේ

අනේ මගේ පුතණුව නේ

තනේ බිබී නැළවෙන් නේ

රන් රුවසේ බබළන් නේ

කිරි බීපන් පුතණුව නේ

වහකෝට්ටේ ගායනා වන පසන් පදමාලාවන්හි මෙකී ස්වභාවය ගැබ් ව තිබේ. පහත පසන් නිදර්ශන ඊට සාක්ෂ්‍ය දරයි.

කුමරු ඉතා රුව ඇත්තේ පව්වද උදුරා ග ත්තේ

එච්චරමයි මට ඇත්තේ මින් වැඩි කුමරෙකු නැ ත්තේ

ස්වාමිදරුවන්ගෙ ගැත්තේ තෙද අන ඇයි නොම ද ත්තේ

කුමක් කරම් ද මේ වැත්තේ පවින් ඉතින් කම් නැ ත්තේ

පිනි බිඳුවන් සුදු පෑ ඉතා බඳු වදමල් පෙති වෙනි ර තා

මෙදෙකින් ඔප වැඩි උවනතා දුටුවන් තුටුකරවන සි තා

දුක් වින්දේ ජුදයින් අතා පවින් මුදම්මැයි ලොව ස තා

සුන් බුන් කැළලක් වැනි ගතා ඉන් දැන් වෑවෙනු බැරි ඉ තා

ඉඳු නිල්මිණි පැහැයෙන් සොඳේ බබලන යුග නුවනත ත දේ

දුටු දුටුවන් සිත ලොබ බැඳේ මනනද කරවන හැම ස දේ

දැක දැක ඔප වැඩි රන් කඳේ වද කරවූවේ ඇයි ත දේ

අත් ඇරලා මගෙ ගුණ කඳේ කෙලෙසක වෑවෙම්දෝ අ දේ

නව මස ගොසින් වදාලා වැඩුණේ රන් කිරි බී ලා

මුඛයෙන් රස බස් දීලා තුතිවන සුරතල් පෑ ලා

මේ ලෙස වද කරවාලා සොඳ දෝ දැන් මරවා ලා

මසිතට තද දුක් දීලා පව් අරගති ජුදයා ලා

මානව සමාජයේ පැවැත්ම උදෙසා මෙන් ම සත්ත්ව සන්තතියේ සශ්‍රීකත්වය උදෙසා දරුවන් බිහි කිරීම මූලික සමාජ අවශ්‍යතාවකි. ඈත අතීතයේ සිට දරුවා යනු වටිනා සම්පතක් ලෙස හඳුනාගැනිණි. දාරක සම්පත් අපේක්ෂා කොට යම් යම් ඇදහිලි, විශ්වාස පැවැති බවට සාධක එමට ය (වීරක්කොඩි,2015). එහෙත් වර්තමානයේ ද එබඳු වත්පිළිවෙත් ප්‍රධාන ලෙස ව්‍යවහාර නො වේ. මානව පැවැත්මේ දාරක - මාතෘ ප්‍රේමය හා පවත්නේ අන්‍යෝන්‍ය සහසම්බන්ධයකිනි. බෞද්ධාගමික සංස්කෘතික වටාපිටාව එය තවත් ශක්තිමත් කරන්නක් වූයේ ය. සිදුහත් කුමරුන් බුදුවීම සඳහා එදා පළමු විවරණය ලබාගත්තේ අම්මා ගෙනැ යි බෞද්ධ සාහිත්‍යයෙන් ප්‍රකට වෙයි. මාතෘ ප්‍රේමය වටා ගෙතී ඇති ජාතක කතා ද රැසකි. ජන හදවතෙහි තැන්පත් වූ මේ ජාතක කතා ශ්‍රී ලාංකේය ජන සමාජයේ බොහෝ ලෙස ප්‍රචලිත ය. ඒ, අත්දැකීම් ප්‍රකාශනය ජන කවිය, ජන කතාව සහ ජන නාට්‍ය ආදි විවිධ මාධ්‍ය ඔස්සේ ව්‍යාප්ත වී තිබේ. පහතරට ප්‍රදේශවල ඒවා කෝලම්, ගැමි නාටක අපරභාගයේ දී විවිධ ජාතක කතා රංගගත වෙත් දී උඩරට ප්‍රදේශයන්හි එය කවි නාඩගම් ප්‍රකාශනයක් ලෙස මේ ජාතක කතා සමාජගත වී තිබෙන අයුරු පෙනීයයි.

ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ “ජගන් මාතා” පිදීමට සමානව “කිරි අම්මා” පිදීම සංකල්පයක් ලෙසින් ආදිවාසී සමාජයේ මුල් බැස ගත්තකි. කිරි අම්මා සශ්‍රීකත්වයේ මෙන් ම ආරක්ෂණයේ ද දෙවඟනකි. දකුණු ඉන්දියානු පත්තිනි මෙරටට සංක්‍රමණය වීමත් සමඟ පත්තිනි ඇදහීම ශ්‍රී ලාංකික සමාජයේ උච්චස්ථානයකට ගමන් කළේ ය. මෙය ගජබා රජ සමයේ සිදුවූවකි (කුලතිලක, 1974). පත්තිනි අම්මා ද වර්තමානයේ ප්‍රචලිත දේව සංකල්පයකි. අතීතයේ සිට පිදුම් ලැබූ කිරි අම්මාවරු රැසකි. සත් පත්තිනි, දොළොස් පත්තිනි හා අම්මාවරු ද රාශියකි.

කවිය මාධ්‍යය කරගනිමින් ‘හැඟීම්’ ප්‍රකාශ කිරීමට මෙරට වැසියෝ ඈත අතීතයේ සිට ම කැමැත්තක් දැක් වූහ. විදේශික වාර්තා මඟින් ද එය තහවුරු වෙයි. ජෝන් ඩේවි සඳහන් කර ඇත්තේ සෑම සිංහලයකු ම පාහේ කවියකු වන බව ය (සෝමරත්න, 2005). ජුවාම් රුබේරු විස්තර කරන පරිදි ශ්‍රී ලාංකිකයෝ කදිමට ගී ගැයීමට  සමත් පිරිසක් වූහ (පොන්නම්පෙරුම, 1969). දාරක ප්‍රේමය උදෙසා කවි නිර්මාණය වී ඇති බව ජන සාහිත්‍ය අධ්‍යයනයෙන් හඳුනාගත හැකි වේ. පවුල් ඒකකයෙහි ඥාති වාචක පද අතර ‘අම්මා’ යන්නට හිමිවූයේ ඉහළ ස්ථානයකි. මන්දයත් ලාංකේය සමාජය මාතෘ මූලික වීම එයට හේතුව වේ. මවක තම දරුවන් වෙත දක්වන ආදරය, ස්නේහය අසීමිත ය. ඒ දාරක ප්‍රේමයෙහි මව ගේ ලෙය කිරට හරවන්නකි. මවු කිරෙන් තම දරුවා පෝෂණය කිරීමට ලාංකික මව අතීතයේ සිට ම උත්සහ ගත්තා ය. ඒ සඳහා ඇය නිරන්තර ව සූදානමින් පසු වූවා ය. අම්මාට මෙලොව ඇති වටිනා ම වස්තුව තම දරුවා වේ. ජන සාහිත්‍යයේ දී ඊට නිදසුන් හඳුනාගත හැකි ය.  විශ්වයේ විශ්වසනීය ජීව උල්පත ‘අම්මා’ පිළිගනු ලබන්නේ එබැවිනි. ඇය මෙත්තා, කරුණා, මුදිතා හා උපේක්ඛාවේ උල්පත ය. ඒ අම්මා ලොව නිමැවුම්කරුවා වන්නී ය. ‘ගෙදර බුදුන් අම්මා’ යන සංකල්පයක් සමාජයෙහි මුල් බැස තිබෙන්නේ මේ අනුව ය. අම්මාගේ ආදරය සෙනෙහස උල්පතේ උනන දිය මෙන් ජන කවියා දුටුවේ ය. ප්‍රවාහයක් ලෙසින් ගලායන පවිත්‍රතාවයෙන් පිරුණු ඒ ආදරය සහ ළෙන්ගතුකම පිළිබඳ ජන සාහිත්‍යයේ නිදසුන් රැසක් තිබේ (සිතියම් සහිත පුරාණ වෙස්සන්තර ජාතක කාව්‍යය, 1975). පන්සල කේන්ද්‍ර කොට ගත් බෞද්ධාගමික පරිසරය වටා ගොඩනැඟුණු ජන ජීවිතයේ ආදරය, සෙනෙහස සම්ප්‍රේෂණය කිරීමට අම්මාවරු නැළැවිලි ගීතය ද උපයෝගි කරගත්හ. වැදි ගෝත්‍රික ජනයා සහ විවිධ ජන කණ්ඩායම් අතර මෙබඳු නැළැවිලි ගී තිබූ බවට සාක්ෂ්‍ය හමු වේ (වීරක්කොඩි, 2015). එකී මාතෘත්වය ‘මරිය මව්තුමී’ සමඟ කතෝලික ජන සාහිත්‍යයේ ද මාධ්‍යයක් බවට පත් වූ බව ඉහත නිදසුන්වල දී දැකගත හැකි වේ. දේව මෑණියන් ගේ ආදරය, සෙනෙහස සම්ප්‍රේෂණය වන්නේ පසන් ගීතය හරහා ය. එකී ගායන වැලපුම් ගායන ක්ෂේත්‍රය පෝෂණයට මෙන් ම ලාංකේය ජන සංගීත පෝෂණයට ද වැදගත් වන්නේ ය.

**නිගමනය**

ලාංකේය ජන විඥානය මැනවින් අවබෝධ කරගත් ජාකොමෝ ගොන්සාල්වේස් පියනම මෙරට සිතුම් පැතුම්වලට ගැළපෙන පරිදි කතෝලික දහම මෙරට සමාජගත කිරීමට කැපවූයේ ය. ලාංකික ජන හදවත්වලට කිඳා බැසගත් 'මාතෘ සංකල්පය' භාව උද්දීපනය සඳහා ප්‍රබල ව යොදා ගත් ගොන්සාල්වේස් පියතුමා, පසන් ගායන ඒ සඳහා වාහකයක් කර ගත් බව මෙහිලා ගම්‍ය වූවකි. මෙකී මාතෘ කේන්ද්‍රීය වලප කතෝලික ජන කණ්ඩායම් අතර ප්‍රාදේශීය විවිධත්වයෙන් යුතු ව භාවිත වන බව ද නිරීක්ෂණය වූවකි. සඳකිඳුරු, ගෝඨයිම්බර, මනමේ බිසව ගේ වැලැපුම ද පත්තිනි වැලැපුම, කොහොඹහැල්ල, කුවේණි අස්න, සූනියම් යාගය ආදි ශාන්තිකර්මයෙහි එන කාන්තා වැලැපුම් අවස්ථා ද සමාජයේ පැතිර පවතී. කුවේණි වැලැපුම, මද්‍රි දේවි වැලැපුම ආදි ශ්‍රී ලාංකේය සමාජයේ පැතිර පවතින මාතෘ පුත්‍ර ප්‍රේමණීය බැඳීම කාව්‍ය රචනයෙහි අන්තර්ගත වී තිබෙනු දැකිය හැකි වෙයි. එකී 'අම්මා ගේ වැලැපුම' අතරට කන්‍යාමරියා මාතෘ වැලපුම මානවවංශ සංගීත අධ්‍යයනයේ සුවිශේෂී මානයකි.

**සමුද්දේශ**


ආරියරත්න, සුනිල්. (1987). *කැරොල් පසන් කන්තාරු*, කොළඹ:සීමාසහිත සුපසන් අධ්‍යාපන සේවා (ප්‍රකාශන) සමාගම.

කුවේණි අස්න, (1886), aka 13 පුස්කොළ පොත.

කුලතිලක, සී.ද.එස්. (1974). *ලංකාවේ සංගීත සම්භවය*. කොළඹ: සී/ස ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම

ගොඩකුඹුරේ, චාල්ස් (1963). *කොහොඹාකන්කාරිය*, බත්තරමුල්ල: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

ගොන්ස්ල්වේස්, ජාකෝමේ. (1936). *දුක්ප්‍රාප්ති ප්‍රසභයෙහි අභිනව කාව්‍ය ප්‍රබන්ධය හෙවත් දුක් ප්‍රාප්ති ළතෝනි*. බොරැල්ල: කතෝලික සභාව.

ගොන්ස්ල්වේස්, ජාකෝමේ. (1948). *දේශනා නවයේ පසන් පොත*. බොරැල්ල : කතෝලික සභාව.

ඩයස්, ෂෙල්ටන්., මීගමුව, 2014.08.05. සින්දාත්‍රි දේව මැඳුර, මීගමුව

පීරිස්, එඩ්මන්ඩ්. (සංස්.). (1979). *දුක්ප්‍රාප්ති ප්‍රසඞ්ගය*. මග්ගොන: ශාන්ත වින්සන් කාර්මික පාසැල් මුද්‍රණාලය.

පීරිස්, එඩ්මන්ඩ්. (සංස්). (1979). *වේද කාව්‍ය*. කොළඹ: කතෝලික මුද්‍රණාල ප්‍රකාශනය.

වැලිකඩආරච්චි, දයා. (2006). *හෙළ කලාවේ කිතුනු සලකුණ*, ගොන්සාල්වේස් සිංහල ආයතනය, මහනුවර.

වීරක්කොඩි, අයි.එස්., (2015). *නැලවිලි ගීයෙන් නිරූපිත සිංහල ජනශ්‍රැතිය*, කොළඹ: ජනමිහිර නිර්මාණ ප්‍රකාශනය.

වීරක්කොඩි, අයි.එස්., (2021). *ලාංකේය බෞද්ධ ජන සංස්කෘතියෙහි නිරූපිත පත්තිනි වැලපුම*, කොළඹ: ජනමිහිර නිර්මාණ ප්‍රකාශනය.

සන්නස්ගල, පුඤ්චි බණ්ඩා., (සංස්), (1994). *සිංහල සාහිත්‍ය වංසය,* බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සිතියම් සහිත පුරාණ වෙස්සන්තර ජාතක කාව්‍යය, (1975). රත්නකාර පොත් ශාලාව.

සෝමරත්න, ඊ එච්. ඇම්. (අනුවාදක), (2005). *ඩේවි දුටු ලංකාව,* බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ

සෝරත, වැලිවිටියේ.,(සංස්), (1966), *බුත්සරණ,* ගල්කිස්ස: අභය ප්‍රකාශකයෝ.

ෆොන්සේකා, කාර්ලෝ එඩ්මන්ඩ්. (1924). *ගොන්සාල්වේස් දේව වේද පුරාණය හෙවත් දේව ශ්‍රී වාක්‍ය ග්‍රන්ථය,* කොළඹ: කතෝලික මුද්‍රණාලය.

***ස්තුතිය***

දූව, පිටිපන, වහකෝට්ටේ ග්‍රාමයන්හි කතෝලික ප්‍රජාවට සහ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා දායක වූ සැමට